**#mediaethicsSL #lka #SinhalaPress #Divaina #January28**

යම් කිසි සිදුවීමක් වාර්තා කිරීමේදී එහි නිරවද්‍යතාවය සහ අපක්ෂපාතීභාවය පුවත්පතක් මගින් සැලකිල්ලට ගත යුතු අනිවාර්‍ය සාධක විය යුතුවේ. මන්දයත්, පුවත්පතක වගකීම වන්නේ පුවත් ඉදිරිපත් කිරීම මිසක කථාන්තර මැවීම නොවනා බැවිනි. එය මාධ්‍ය ආචාර ධර්මයක් ලෙසින් පවා හඳුනාගැනෙන්නේ එහෙයිනි.

කෙසේ නමුත් පසුගිය දිනවලදී රට පුරාම කථාබහට ලක්වුණු බදුල්ල මහ ඇමතිවරයා විසින් විදුහල්පතිනියක දණ ගැස්වූයේයැයි චෝදනා කෙරෙනා සිදුවීම දිවයින පුවත්පත මගින් ආවරණය කර ඇති ආකාරය දෙස බලනා විට උක්ත ආචාර ධර්මය නැවතත් සිහිපත් කරදීමට සිදුවනු ඇත. මෙහිදී ලිපිය තුළ පැහැදිලිවම "වර්ගවාදී විදුහල්පතිනියත් නීතිය ඉදිරියේ දණගස්වන්න " යනුවෙන් සඳහන් වේ. එසේ මෙම දමිළ ජාතික විදුහල්පතිනිය වර්ගවාදී යැයි නිගමනයකට පැමිණීමට තුඩු දී ඇත්තේ ඇය පාසැලට ඇතුළත් කරගන්නේ දමිළ සිසුසිසුවියන් පමණක්ය යන චෝදනාවයි. මෙම චෝදනාව සත්‍යද යන්න පිළිබඳව දිවයින පුවත්පතටද නිශ්චිතවම කිව නොහැකි බව, ලිපියේ එම චෝදනාව සමගින් "...ඇය එසේ කරනවා නම් එය බරපතළ වරදකි." යනුවෙන් සඳහන් වන වාක්‍යයෙන් වැටහෙනු ඇත. එසේ නම් විදුහල්පතිනිය වර්ගවාදී යැයි සෘජුව චෝදනා කිරීම සාවද්‍ය තොරතුරු ජනගත කිරීමක් සහ ලිපියේ තිබිය යුතු අපක්ෂපාතීත්වය අනතුරට බඳුන් කරන්නක් නොවේද?